පිළියන්දල අධ්‍යාපන කලාපය
**Piliyandala Education Zone**

8 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය 2017 ජූලි **Second Term Test 2017 - Grade 8**

සිංහල භාෂාව හා සාහිත්‍ය

කාලය පැය 2
Two Hours

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01) විභාග ප්‍රතිඵල එනතුරු විභාග අපේක්ෂකයෝ ඇඟිලි ගනිමින් සිටියහ.
i) පීඩාවෙන් හා බියෙන් ii) නොසන්සුන්ව
iii) අපේක්ෂාවෙන් iv) මහත් සතුටින්

02) ගම් වැදුණු අලි ඇල්ලීමට පොලීසිය විසින් කරන ලද්දේ කුනිස්සන්ට දැල් දැමීම වැනි ක්‍රියාවකි.
i) ප්‍රයෝජනවත් ක්‍රියාවක යෙදීම. ii) නිෂ්ඵල ක්‍රියාවක යෙදීම.
iii) වටකර ඇල්ලීම. iv) දැඩි වෙහෙසක් දැරීම.

03) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන යුගලය තෝරන්න.
i) ගෝලීය කරණය - කළමනාකරණය ii) දූෂන - භීෂන
iii) පුෂ්පය - නිෂ්පල iv) පරිගනක - ගණකාධිකාරි

04) සිංහල අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර පමණක් යෙදුණු වරණය වන්නේ,
i) ග, ජ, ඩ, ද, ඹ ii) ශ, ෂ, ස, හ, ෆ
iii) ඝ, ඣ, ඪ, ධ, භ iv) ක, ච, ට, ත, ප

* මුලින් දී ඇති පදයට සමාන නොවන පදය තෝරන්න.

05) දිජ - i) පක්ෂි ii) කොඩි iii) වස්ත්‍ර iv) කුෂ්ඨය

06) නා - i) ඇතා ii) නායක iii) නයා iv) ජලය

* මුලින් දී ඇති පදයට විරුද්ධ අර්ථය ගෙන දෙන පදය තෝරන්න.

07) පටහැණි - i) නිසැක ii) එකඟ iii) ප්‍රත්‍යක්ෂ iv) අනුමාන

* පහත සඳහන් වාක්‍යාංශය සඳහා සුදුසු තනි වචනය තෝරන්න.

08) බොහෝ ඇසූ පිරූ තැන් ඇති.
i) බහුශ්‍රැත ii) කථික iii) බුද්ධිමත් iv) අනුමාන

09) "කැලේ තිබෙන කොයි දේවත් රසවේවා" යන වාක්‍යය
i) විධික්‍රියා අර්ථයෙහි යෙදෙන ආශිර්වාද ක්‍රියාවකි.
ii) අසුබ පැතුම් අර්ථයෙහි යෙදෙන ආශිර්වාද ක්‍රියාවකි.
iii) සුබ පැතුම් අර්ථයෙහි යෙදෙන ආශිර්වාද ක්‍රියාවකි.
iv) ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථයෙහි යෙදෙන වාක්‍යයකි.

10) විධික්‍රියා පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න
i) දුවයි, බලයි, නටයි, ගයයි.
ii) කරව, සැතපෙව, ලියන්න, බලනු
iii) සැදේවා, වැජඹේවා, වැනසෙත්වා, දිනේවා
iv) ගැයුවේය, බැලුවේය, නැටුවේය, ඇඩුවේය.

* මුලින් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදය තෝරන්න.

11) සර්ව නාම
i) ඔවුහු ii) හෙතෙම iii) මම iv) දරුවෝ

12) ක්‍රියා නාම
i) දක්ෂ ii) කියමන් iii) බලන iv) නරඹන

13) තද්ධිත නාම පදයක් වන්නේ,
i) රත්මල් ii) සත්මහල් iii) දේශිය iv) බුදුබණ

14) කෘදන්ත නාම පමණක් ඇතුළත් පද යුගලය තෝරන්න.
i) ඇත්දළ - සියපත් ii) වවන්නෝ - රකින්නෝ
iii) ඉංදියාව - සිළුමිණ iv) දක්ෂ - තරුණ

15) නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් ඇතුළත් වාක්‍ය තෝරන්න.
i) සුදු නංගි මල් කඩයි ii) අයියා වේගයෙන් දුවයි.
iii) ගැහැණු ළමයා වේගයෙන් දුවයි. iv) අක්කා පාසලට යයි.

16) අසත් පුරුෂයා ගිය ගිය තැන නරක ම කිරීම
i) ඇගේ ඉදන් කන කනවා වාගේ ii) ඉබ්බා කට හින්දා නැහුණා වාගේ
iii) ගලේ කෙටුව අකුර වගේ iv) උරුලෑව ගිය පාර වගේ

17) රෝදයක් මෙන් කොනක් නැති කාලය .................................... නමින් හැඳින්වේ.
i) අට සාලිස් ii) සත් මහල් iii) කාලත්‍රපරිග්‍රහය iv) කාලචක්‍රය

* ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

18) i) අක්කා වැඩට ගියේය. ii) නා හිමියෝ දහම් දෙසූහ
iii) ශිෂ්‍යාවක් ගී ගැයූහ. iv) උකුස්සන් ඉහළ අහසේ පියැඹූහ.

19) i) සරුංගල් අහසේ ලෙළ දෙයි. ii) තාරකා අහසේ බබළති
iii) ගුවන් යානය ගුවන් තොටුපළට ළඟා වූහ. iv) ගංගාවෝ මුහුදට ගලා බසියි.

20) i) විදුහල්පතිතුමා සිසුන් ඇමතුවාය. ii) ගුරුතුමිය සිසුන්ට තෑගී පිරි නමති.
iii) අපි ක්‍රීඩා උත්සවයට සහභාගී වන්නෙමු. iv) තාත්තා වැඩට ගියාය.

(ලකුණු 2x20=40)

11 කොටස

* 01, 02 ප්‍රශ්න අනිවාර්යය වේ. 03, 04, 05, 06, 07 යන ප්‍රශ්න වලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01) දේශාභිමානී ගීත පිළිබඳව සකස් කළ පොත් පිංච ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1) පොත් පිංචට ඇතුළත් කළ දේශාභිමානී ගීත 4ක් නම් කරන්න. (ල. 04)

2) එහි ඇතුළත් කළ එක් ගීතයක අදහස කෙටියෙන් ලියා දක්වන්න. (ල. 04)

3) ඔබේ පොත් පිංච නිර්මාණශීලීව සකස් කිරීමේදී යොදා ගත් පිට කවරය ඇඳ දක්වන්න. (ල. 02)

4) පොත් පිංච සකස් කිරීමේදී ඔබ තුළ වර්ධනය වූ කුසලතා 02ක් ලියන්න. (ල. 04)

5) පොත් පිංච සැකසීමේදී ගුරුතුමා / ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් 02ක් ලියන්න.(ල. 02)

(මුළු ලකුණු 16)

02) පහත සඳහන් මාතෘකාවලින් එකක් යටතේ වචන 150ක පමණ රචනයක් ලියන්න.

1) මා දුටු ඇසළ පෙරහැර.

2) කියවීම පිරිපුන් මිනිසකු වන්නට මග සලසන විනෝදාංශයකි.

3) මාගේ අනාගත පැතුම.

4) සමගියෙන් ජීවත්වීමේ වැදගත්කම.

5) මා ගිය අධ්‍යාපන චාරිකාව (ල. 14)

03) i) වර්තමානයේ කැලිකසළ ජන ජීවිතයට මහත් තර්ජනයක් එල්ල වී ඇත. මේ පිළිබඳ අවධානය යොමු කොට අස්ගිරිය පරිසර සංරක්ෂණ සංවිධානයේ ලේකම් ඔබ යයි සිතා තම නිවස තුළින් ම කසල කළමණාකරන ආකාරය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා පහත දක්වෙන කරුණු ඔස්සේ දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

* කැලිකසළ වර්ග කිරිම (දිරන, නොදිරන)
* දිරන ද්‍රව්‍ය පොහොර කර වගාවන් සඳහා යොදා ගැනිම.
* ඒ තුළින් ඇති වන ආර්ථික වාසි
* පොලිතින් අවම කිරිම හා විකල්ප ඇසුරුම් මාධ්‍ය පිළිබඳ දැනුවත් කිරීම.

හෝ

ii) පාලගම මිණිමුතු ක්‍රීඩා සමාජයට සාමාජිකයින් බඳවා ගැනීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් පිළියෙල කරන්න.

(ල. 10)

* පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

04) '' කාටවත් මොකවත් වුණොත් දැන ගන්නේ කොහොම ද?

i) මෙම ප්‍රකාශය උපුටාගත් පාඩම නම් කරන්න. (ල 2)

ii) එම පාඩම උපුටාගත්තේ කුමන කෙටිකතා සංග්‍රහයෙන්ද? (ල 2)

iii) එහි කතුවරයා කවරෙක්ද? (ල 2)

iv) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින්ද? (ල 2)

v) මේ ප්‍රකාශය කළේ කා හට ද? (ල 2)

(ලකුණු 2x5=10)

05) ''මම දන්නවා ලස්සන සින්දු කියන ඒ කිරිල්ලිය ඉන්න තැන''.

i) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද? (ල 02)

ii) ප්‍රකාශය කළේ කා හටද? (ල 02)

iii) ලස්සන සින්දු කියන කිරිල්ලිය සොයා දෙන ලෙස අණ කළේ කවරෙක්ද? (ල 02)

iv) එසේ සොයා නොදුනහොත් ඔවුන්ට අත්වන ඉරණම කුමක්ද? (ල 02)

v) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද? (ල 02)

(ලකුණු 10)

06) පහත පද්‍ය පාදයන් හි ඉතිරි කොටස් සම්පූර්ණ කරන්න.

1) වැසි වසිනා අහස අපි
මුතු බඳිනා මුහුද අපි
........................................ ....................
........................................ .................... (ල 2)

2) අපේ පැතුම් අහසට විහිදී යයි
කම්හල්වල දුම් වළලු දිගේ
........................................ ....................
........................................ .................... (ල 2)

3) ඉහත ගීතය ඇතුළත් පාඩමේ නම කුමක්ද? (ල 2)

4) එය ලියූ ගීත රචකයා කවරෙක්ද? (ල 2)

5) මෙම ගීතය ගායනා කරන ගායකයා නම් කරන්න. (ල 2)

07) පහත සඳහන් ඡේදය කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

හින්දු භක්තිකයන්ට අනුව කතරගම දෙවියා යනු ස්කන්ද කුමාර නමින් හැඳින්වෙන දෙවියා ය. හින්දූන්ගේ මෙන් ම බෞද්ධයන්ගේ ද වන්දනාමානයට පාත්‍ර වූ මේ දෙවියා ලංසයක් හෙවත් වේලායුධයක් අතින් ගෙන මොනරකු පිට නැඟී විලාසයෙන් නිරූපණය වෙයි.

ස්කන්ද කුමාර හෙවත් කතරගම දෙවිඳුන්ට මුහුණු සයක් හා අත් දොළසක් ඇතැයි කියනු ලැබේ. නෙත් දොළසක් ද ඇතැයි යන විශ්වාසය නිසා ඔහු බරනෙත නමින් ද හඳුන්වනු ලැබේ. එක් ජන ප්‍රවාදයකට අනුව මෙසේ වී ඇත්තේ විෂ්ණු විසින් ඊශ්වරයා හමුවේ මායාවකින් මවන ලද කුමාරවරුන් හය දෙනා දුටු උමාව විසින් කුමාර කන්දක් නොවේ දැයි කියමින් අල්ලා ගැනීම නිසා ඔවුන් ඒකාබද්ධව එක තැනැත්තකු බවට පත් වීමෙනි.

1) හින්දු භක්තිකයන්ට අනුව කතරගම දෙවියන් යනු කවරෙක්ද?
2) මෙම දෙවියන් වන්දනාමාන කරන ජන වර්ග දෙකක් නම් කරන්න.
3) කතරගම දෙවියන් බරනෙත යනුවෙන් හඳුන්වන්නේ ඇයි.
4) කතරගම දෙවියන්ගේ අතෙහි ඇති ආයුධය හඳුන්වන නම කුමක්ද?
5) කතරගම දෙවියන්ගේ ස්වභාවය ඡේදයට අනුව කෙටියෙන් ලියන්න. (ලකුණු 2x5=10)